Page 18 April 2013.qxd 28/05/2013 16:28 Page 1

මගීන් SriLankan මගහරින්නේ ඇයි?

♦ *ආනන්ද කාරියවසම්ගේ තිත්ත අත්දැකීමක් !*

ලංකාවිත්ති පසුගිය කලාපයක ජෝර්ජ් කුමාරසිංහ මහතා විසින් ලියනලද "අනේ අපේ රටේ සංචාරක හෝටල් " යන සිරස්තලය යටතේ ලියූ ලිපිය කියවා මෙය ලියන්නට අදහස් කළෙමි. තමන්ගෙ රටේ මිනිසුන්ට ඉතා පහත් ලෙස සලකන එකම රට ශ්‍රීලංකාව විය හැක.

පසුගිය වසර තිස් පහකට (35) අධික කාලයක් තිස්සේ ලංකාවට ගිය සෑම අවස්ථාවකම (දෙවරක් හැර) මා ගමන් ගත්තේ අපේ රටේ ගුවන් සේවය සමගිනි. ඒ යන්නට වෙනත් ගුවන්සේවා නැති නිසා නොව තමන්ගේකම නිසාය.

මා ගුවන් බලපත්‍රයක් සඳහා කරන වියදම පවා අප රටේ ආයතනයකට දෙන්නට අවශ්‍ය නිසාය. ලංකාවෙන් දේශපාලනඥයින් එන විට ඔවුන්ට විරුද්ධව උද්ඝෝෂණය කරන දෙමළ ඩයස්පෝරාවෙන් ඔවුන් ආරක්ෂාකරන්නට, ඔවුන්ට සහයෝගය දක්වන්නට මෙහි අව්, වැසි, හිමපතනය නොතකා සීතලේ ගැහෙමින් බොහෝ වාරයන් සිටියේ අපේකම නිසා ය.

අඩුම තරමින් අවුරුද්දකට එක ගමනක්වත් මම ලංකාවට යමි. ඇතැම් අවුරුදුවල දෙතුන් වර ගොස් ඇත. 2010 දෙසැම්බර් මාසයේ සති පහක නිවාඩුවකට මා ලංකාවට ගියේ සුපුරුදු පරිදි ශ්‍රීලංකා ගුවන් සේවය සමගිනි. හීත්රෝ ගුවන් තොටුපලින් යානය පිටත් වුණේ රාත්‍රී 9.45 ට ය.

ගුවන් යානයේ රාත්‍රී ආහාර පිළිගැන්වූ පසු මට තේ කෝප්පයක් බොන්නට අවශ්‍ය විය. ආහාර ගෙන හමාරවී පැය බාගයකටත් වඩා ගත වුවත් තේ කෝප්පයක් නොලැබුණු නිසා ගුවන් සේවිකාවකගෙන් තේ එකක් ඉල්ලුවෙමි. පොරොන්දු වූ නමුත් ලැබුණේ නැත.

එහෙත් එක දෙයක් මට පැහැදිලිව පෙනුණි. එනම්, සුදුහම තිබූ මගීන් ඉල්ලූ පමණින් ඔවුන්ට ඉල්ලූ දේ ලැබුණු බව ය.

තවමත් තේ කෝප්පයක් නොලද බැවින් මම තව වරක් ඉල්ලූ නමුත් ගෙනැත් දෙන්නම් යන පොරොන්දුව මිස තේ එක ලැබුණේ නැත. ඊට වසර ගණනකට පෙර ශ්‍රීලංකා ගුවන් සේවය ලෝකයේ ගුවන්යානා සමාගම් අතර ප්‍රමුඛස්ථානයේ සිටි බව අපි අසා ඇත්තෙමු. මා දෙවන වරටද කළ ඉල්ලීමටද ප්‍රතිචාරයක් නොමැතිවූයෙන් තෙවැනි වරටත් තේ කෝප්පයක් ඉල්ලුවෙමි. තවත් විනාඩි කීපයකට පසුව ගුවන් සේවිකාව මට තේ කෝප්පයක් ගෙනැවිත් දුන්නාය. ඒ වන විට මා කෑම කා ඉවරවී සෑහෙන වෙලාවක් ගතවී තිබුණි.

එහෙත් මේ අතරේ මම එක දෙයක් හොඳින් වටහා ගත්තෙමි. මට තේ කෝප්පයක් ගෙන්නගන්නට මෙතරම් වේලාවක් ගතවූවත්, ඒ සඳහා මට තුන්වරක් ඉල්ලන්නට සිදුවූවත්, එම යානයේ මා අවට සිටි සුදු හම ඇති විජාතික මගීන්ට ඉල්ලන පරක්කුවෙන් කිසිදු ප්‍රමාදයකින් තොරව ඒ ඉල්ලූ කෑම බීම වහා ලැබුණු බවයි. මේ වෙනස දුටු මට ඇතිවූයේ බලවත් කළකිරීමකි.

මම තේ එක ගෙනා ගුවන් සේවිකාවට මෙසේ කීමි. " මේ සේවය මහා ජරා තත්වෙට දැන් වැටිලා..... මට තුන් පාරක් තේ කෝප්පයක් ඉල්ලන්න සිද්ධ වුණා .....මෙහෙමද ඕගොල්ල මගීන්ට සළකන්නෙ.....?"

විනාඩි 2 ක 3 කට වඩා ගත වුනේ නැත. තරබාරු මිනිසෙකු මා ඉදිරියට අවුත් හිටගත්තේය. ඔහුගේ ඇඳුම් පැළඳුම් වලින් ඔහු ගුවන් යානාවේ සේවකයින්ගේ නායකයා බව මම දැනගතිමි.

" What's the matter? What's your problem?" ඔහු කිසි ගරු සරුවක් නැතුව මගෙන් ඇසුවේය. ඔහුගේ මුහුණේ වූයේ දැඩි කෝපයක බැල්මකි. ඒ බැල්මටත් හැසිරුණු ආකාරයටත් මට එක් වරම සිතුනේ ඔහු ඇමති මර්වින් සිල්වාගේ බොඩි ගාඩ් කෙනෙකු කියා ය. ඔහු මිනිස්සුන්ට, විශේෂයෙන් ගුවන් යානයක මගීන්ට කතාකරන විධියවත්, සලකන විධියවත් දැනසිටි බවක් පේන්නට තිබුණේ නැත. ඔහු ලංකාවේ ප්‍රයිවට් බස් එකක කොන් දොස්තර වැඩකටවත් සුදුසු කෙනෙකුයි සිතන්නට නොහැකිය. වසර ගණනක් තිස්සේ තමන්ගේ රට ගැන සිතා මුදල් දී මෙවැනි සත්කාර ලබන්නේ ඇයි දැයි එවෙලේ මම සිතුවෙමි.

ඔහු පැවසූ දෙයින් මම තවත් විස්මිත වීමි. ඔවුන්ට ශ්‍රීලංකා ගුවන් සේවයෙන් දී ඇති උපදෙස් අනුව සුදුහම ඇති පිරිමි මගියෙකු හා අපේ දුඹුරු හම ඇති කාන්තාවක් යානයේ එකට වාඩිවී සිටියත් ඉස්සෙල්ලාම සංග්‍රහ කළ යුත්තේ සුදු හම ඇත්තාටය. ඔවුන් ගැන සොයා බැලූ පසුවය, අපේ අයට සංග්‍රහ කරන්නට හැකියාව ඇත්තේ.

ලංකාවට ගොස් දින තුනකට පසු මැලේසියාවේ පිනැන්ග් නගරයට යන්නට මට වුවමනාව තිබුණි. ඒ ගමන යාමට ද මා යොදාගෙන තිබුණේ ශ්‍රීලංකන් ගුවන් සේවයයි. ක්වාලාලම්පූර් වලට ගොස් එතැනින් එයාර් ඒසියා Air Asia මගින් සඳහා වෙන්කර තිබූ පර්යන්ත ගොඩනැගිල්ලට යන්නට මට අවශ්‍ය වී තිබුණි. එයා ඒසියා ගුවන්සේවය ආරම්භ කළේ ඒ පර්- යන්තයෙනි. (Terminal) එය පිහිටා තිබුණේ ක්වාලාලම්පූර් ප්‍රධාන ගුවන්තොටුපළේ ගොඩ නැගිල්ලේ සිට සැතපුම් 8 ක දුරිනි. එයට බස් රථයකින් හෝ කුලී රථයකින් යා හැකිය. බසයෙන් ගමන් කරන් නේ නම් රිගිට් 3 ක් පමණ අය කරන අතර, කුලී රථයකට රිගිට් 50 ක් පමණ අය කරති.

බස් රථයෙන් යාම සඳහා ඉක්මනට මා බස්නැවතුමට යායුතු වීය. ඒ නිසා ම මම අතේ ගෙනියන බෑගය හැර වෙනත් බෑගයක් රැගෙන නොගියෙමි. එහි කලිසමක් දෙකක්, කමීස තුනක් හා තුවායක් හැර වෙනත් දෙයක් තිබුණේ නැත. ගුවන් යානය ඇතුළට ගෙන යන බෑගය කිලෝ 7 කට වඩා වැඩි නොවිය යුතුයයි ගුවන් සේවය කියයි. මගේ බෑගයේ බර කිලෝ 8 ක් විය. මා කවුන්ටරයට යන විට වෙලාව උදේ 5 ට පමණ ඇත.

එම කවුන්ටරයේ සිටි ශ්‍රීලංකන් ගුවන් සේවයේ සේවිකාව බෑගයේ බර බලා කිලෝ 8 ක් නිසා ගුවන් යානය ඇතුළට ගෙනයන බෑගයක් ලෙස නොව පිටතින් යානයට පටවන බෑගයක් ලෙස යවන්නට සූදානම් වනවිට මා ඇයට ආයා වනාකර මට එම බෑගය ගුවන් යානය ඇතුළට ගෙනයාමට ඉඩ දෙන ලෙස ඉල්ලා සිටියෙමි. ඒ වෙන කිසිවක් නිසා නොව යානයෙන් පිටතට ආ විගස මට Air Asia Terminal එකට ඉක්මනින් යාමට අවශ්‍ය නිසාය. එහෙත් ඇය මගේ ඉල්ලීම ප්‍රතික්ෂේපකර එය බර බෑග් එකක් හැටියට යවන්නට වෙනම යැව්වාය. ඒ ගැන මගේ අමනාපයක් නැත. ඇය කළේ තමන්ගේ නියම රාජකාරිය නොවේ දැයි මම කල්පනා කළෙමි.

එහෙත් මා සිතුවා වැරදිය. ගුවන් යානයට නගින්නට ඇති පෙදෙස හෙවත් Departure Lounge එකට ගිය විට මම පුදුමයට පත්වීමි. කිලෝ 1 ක් වැඩි වූ පමණින් අර කාන්තාව මට මගේ බෑගය ඇතුළට ගෙන යා නොහැකියයි කීවත් මෙතැන සිටි විදේශික සංචාරකයින් සියළු දෙනාම පාහේ කිලෝ 10, 12 හෝ 15 තරමේ විශාල බෑග් අතැතිව යානයට නගින්නට සූදානම්ව සිටියහ. ඒ අයට අවසර ලැබුණේ කෙසේද? ඒ අන් කිසිවක් නොව ඔවුන් හම සුදු අය නිසා ය.

මා ලංකාවේ සිට ආපසු ලන්ඩනයට එන විට ගුවන් යානය තුළදී මිත්‍ර වූ ගුවන් සේවකයෙකුට මගේ අම්හිරි අත්දැකීම් ගැන විස්තර කළෙමි. එය අසා ඔහු පැවසූ දෙයින් මම තවත් විස්මිත වීමි. ඔවුන්ට ශ්‍රීලංකා ගුවන් සේවයෙන් දී ඇති උපදෙස් අනුව සුදුහම ඇති පිරිමි මගියෙකු හා අපේ දුඹුරු හම ඇති කාන්තාවක් යානයේ එකට වාඩිවී සිටියත් ඉස්සෙල්ලාම සංග්‍රහ කළ යුත්තේ සුදු හම ඇත්තාටය. ඔවුන් ගැන සොයා බැලූ පසුවය, අපේ අයට සංග්‍රහ කරන්නට හැකියාව ඇත්තේ. තව දුරටත් ඔහු කියා සිටියේ දැන් ගුවන්සේ-වයේ සිටින බොහෝ දෙනෙක් අළුත් සේවකයින් බවත්, බොහෝ දෙනෙක් දේශපාලකයින්ගේ හෙංචයියලා බවත්ය. ඔවුන් හරිහැටි පුහුණුකරනු ලැබූ අය නොවන අතර මගීන්ට සළකන අයුරු පිළිබඳ සම්මත නීති රීති පිළිපදින අය නොවන බව ද පැවසීය.

ඔහු උදාහරණයක්ද ගෙන හැර පෑවේය. එනම් ඔහු සහභාගි වූ එක ගුවන් ගමනකදී එක් ශ්‍රීලංකන් ගුවන් සේවිකාවක් මගීන්ට කෑම බෙදාගෙන යන අතරේ පොඩි පාන් රෝල් එකක් මදිවූ විට ආපසු ගොස් එය ගෙනෙනු වෙනුවට ඇත සිටි තම සගයෙක් අමතා " අයියේ ඔය රෝල් එකක් මෙහාට විසි කරන්නකෝ " යනුවෙන් ඇය කෑගසූ බව ඔහු කීවේය.

කාරණා කටයුතු කෙසේ වෙතත් එක දෙයක් මනාලෙස පැහැදිලි ය. ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ දැන් ගන්න දෙයක් නැත. හැම දෙයක්ම දේශපාලනීකරණය වන රටක සාරධර්ම විනීතකම් ගැන කතා කිරීමත් නිශ්පළ වැඩකි. නුදුරු අනාගතයේදී ශ්‍රීලංකාව පෙරදිග ආශ්චර්‍යය බවට පත්කරන බවක් ලංකාවේ දේශපාලනයෙන් අසන්නට ලැබේ. එය අපේ රටේ කාට හෝ වැරදීමකින් කියවුණු දෙයක් විය යුතුය.

ආශ්චර්‍යය කෙසේ වුවද අවුරුදු 30 කට පසු ප්‍රථම වතාවට මම වෙනත් ගුවන් සේවයකට අයත් යානයකින් ගිය වසරේ ශ්‍රීලංකාවට ගියෙමි. ඉදිරි කාලයේ ද යතත් මා යන්නේ එසේම ය.

♦ **Ananda Kariyawasam**
Slough Berks UK

තිබහට වතුර නොදෙනා ගුවන් යානය

එක්සත් රාජධානියේ ජීවත්වන මම සෑම වසරකම පාහේ මගේ ඥාතීන් බලන්නට ශ්‍රීලංකාවට යන්නෙමි. ඒ හැමවාරයකම මා යොදා ගත්තේ අපේ යයි කියනු ලබන ශ්‍රීලන්කන් ගුවන් සේවයයි.

ගිය අවුරුද්දේ ලංකාවට ගොස් එන විට ගමනේ අවසාන කොටසේදී මට හිසරදයක් සැදුණි. ඒ සමග දැඩි පිපාසයක්ද දැනිණ. මා ළඟ තිබූ ඇනඩින් පෙත්තක් ගිලින්නට පිතා ගුවන් සේවිකා වකගෙන් වතුර එකක් ඉල්ලුවෙමි. ඇය ඊට දුන් පිළිතුර " ප්ලයිට් එක ලන්ඩන් හීත්රෝ එකේ ලැන්ඩ් කරන්න තව පැය බාගයයි තියෙන්නෙ" යන්නය. මම නැවතත් " මට වතුර එකක් දෙන්න" යයි ඉල්ලූ වෙමි. එවිටද ඇය කලින් පිළිතුරම දී යන්නට ගියාය. පිපාසය ඉවසන්නට බැරිම තැන මම නැගිට යානයේ පිටුපස කුස්සිය පැත්තට ගියෙමි. එතැන සේවිකාවෝ කතාකරමින් සිටියෝය. ඒ කිසිවෙකු මගේ දිහා බැලුවේවත් නැත. එතැන කවුන්ටරයක් උඩ තිබුණු බාගයක් හිස් වතුර බෝතලයකින් ප්ලාස්ටික් කෝප්පයක්ද සොයාගෙන වතුර එකක් නවාගෙන බී ආපසු මගේ ආසනයට විත් හිඳගතිමි.

මේ අවුරුද්දේ ද ශ්‍රීලංකාවට ගොස් සති තුනකට පසු පසුගිය මාර්තු අග ආපසු ලන්ඩනයට එනවිට මට සිදුවූ තවත් දෙයකි මේ.

අන් සියළු මගීන් මෙන් මමද ශ්‍රීලන්කන් යානයේ මෙනු පතෙන් මට ගැලපෙන මස් නැති කෑම වර්ගයක් තෝරා ගත්තෙමි. අනෙක් සියළු අයට ඒ ඉල්ලූ කෑම වර්ග ලැබුණත් මා තෝරාගත් කෑම නැති බව බොහෝ වේලාවකට පසු ගුවන්සේවිකාව පැමිණ කීවාය. " චිකන් කෑම එකක් නම් දෙන්න පුළුවන් " යයි ද කීවාය. මා මස් නොකන බව ඇයට කී විට, " මං මොනවා හරි වෙන තියනවද බලන්නම් " කියා ගියාය. ගියා ගියාමය ආවේ නැත. මම කෑම ගෙනෙනතුරු බලා සිටියෙමි. යානයේ සියළුම මගීන් කෑම කා කෝපිද බී අවසානය.

පැයකට ආසන්නව ගතවී ඇතත් මට තවම ආහාරයක් ලැබුණේ නැත. මම නැගිට අර ගුවන් සේවිකාව සොයා ගියෙමි. ඇය වෙනත් කිසිවක් කරමින් සිටියාය. " මට කෑම ලැබුණේ නෑ තවම " මම කීවෙමි. " හා මට අමතක වුණා " යයි ඇය කීවාය. මම ආපසු ගොස් හිඳ ගතිමි. තවත් විනාඩි දහයකට පමණ පසු ඇය කෑම එකක් ගෙනැවිත් දී ගියාය. එය බාගෙට තැම්බුණු පැස්ටා වර්ගයකි. එයට අමු බිත්තරයක්ද මිශ්‍ර කර තිබුණේය. බඩගිනි නිසා ඉන් ටිකක් කෑවත් එය හරිහැටි උයන ලද්දක් නොවන බවත් අයිස් පෙට්ටියෙන් ගෙන යාන්තමට රත්කරගෙන ආ එකක් බවත් වැටහිණ. පැත්තක් තවම සීතලය. හැඳි දෙකකට වඩා මා ඉන් කෑවේ නැත. මට දැනුණේ දැඩි අපුලකි. මම එය පසෙකින් තැබුවෙමි.

තව පැය දෙකකට පමණ පසු මා ලන්ඩනයට ආ සැනින් හීත්රෝ තොටුපළේදීම මගේ බඩ දහලන්නටත් වමනේ යන්නටත් විය. ගෙදර විත් එහෙම්ම ඇඳට වැටුණෙමි. පසුදා ද සුව නොවූ නිසා මම මගේ පී පී **(G P)** හමුවී ප්‍රතිකාර ගත්තෙමි. ඒ අජීර්ණය සුව වූයේ දින කීපයකට පසුවය. මින් මතු ජීවිතයේ කිසිම දිනක යළිත් ශ්‍රීලන්කන් ගුවන් සේවයෙන් ගමන් නොයන්නට මම දැඩි ලෙස ඉටා ගත්තෙමි.

♦ ***මල්කාන්ති රත්නායක*** **Milton Keynes UK**

යුරෝපයේ විශාලතම බෞද්ධ විහාරය *බර්මිංහැම් හි ඉදිවනු ඇත*



බර්මිංහැම් මහා විහාරය අද

බර්මිංහැම් බෞද්ධ මහා විහාරය මේ ළඟදී තවත් උත්කෘෂ්ට ආගමික කර්තව්‍යයක් සඳහා සැලැසුම් අවසර ලබාගෙන ඇත. ඒ අනුව ඉදිරියේදී එහි ඉදිකිරීමට නියමිත විහාරය සහ විශාල බෞද්ධ මන්දිරය තැනූ පසු එය මුළු මහත් යුරෝපයේම ඇති විශාලතම බෞද්ධ ආයතනය වන බව බර්මිංහැම් මහා විහාරාධිපති පූජ්‍ය විතාරන්දෙනියේ කස්සප හිමියෝ පවසති.

බර්මිංහැම් යනු එක්සත් රාජධානියේ තිබෙන නගර අතුරින් බහු ජාතික බහු ආගමික ජන කොටස් වලින් සැදුම් ලත් මහා නගරයකි. විවිධ ජන වාර්ගික කොටස් වෙසෙනා නමුදු ඔවුන් අතර ආගමික වශයෙන් විශාල එකමුතුකමක් පවතී. කස්සප ස්වාමීන් වහන්සේ මෙහෙය වන වර්තමාන බර්මිංහැම් මහා විහාරය එකී ආගමික එකමුතුවට ඉතා කැපවීමකින් ක්‍රියා කරන මධ්‍යස්ථානයකි.

මෙම නව යෝජිත විහාර සංකීර්ණයේ සැළසුම්කරු හා ගෘහ නිර්මාණ ශිල්පියා ලාංකිකයෙකු වන දිනුක රාජපක්ෂය. එංගලන්තයේ තැනෙන බෞද්ධ මන්දිරයක් නමුදු එය පාරම්පරික බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය පිළිබිඹු වන ආකාරයට නිම කරන්නට උත්සාහ ගන්නා බව කියති. විහාර මන්දිරය මුදුනේ දැකුම් කළු ස්තූපයක්ද ඉදිවෙයි ඉදිරිපස වහල ලාංකික ගෘහ නිර්මාණ ශිල්පීය ක්‍රම විදහා පාන උඩරට සම්ප්‍රදායට අනුව තැනෙන්නකි. මේ සියල්ල බර්මිංහැම් මහා විහාරාධිපති කස්සප ස්වාමීන් වහන්සේගේ දශක දෙකක කැපවීමේ ප්‍රථිපල වෙති. බුදුදහම යුරෝපයේ ප්‍රචලිත කරන්නට උන්වහන්සේ ගෙන ඇති මහඟු පියවරවල් ජාත්‍යන්තර වශයෙන් අගැයීමට ලක්ව ඇත.